# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 7.0

**ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි**

# නිපුණතා මට්ටම - 6.7.2

**භෞතික පරිසරයේ වටිනාකම තේරුම්
ගෙන පරිසර සංරක්ෂණයට දායක වෙයි .**

# පාඩම

**16 රකින විට පරිසරය - රැකෙනු ඇත අප සැම**

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 7.0**
**නිපුණතා මට්ටම - 6.7.2**
**පාඩම - 16 රකින විට පරිසරය රැකෙනු ඇත අප සැම**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ සෑම වසරකම,

1. ජුනි 05 වන දාටයි.
2. ජුලි 05 වන දාටයි.
3. නොවැම්බර් 05 වන දාටයි.
4. දෙසැම්බර් 05 වන දාටයි.

**02**. පරිසරය යනු,

1. මිනිසා හැර සියලු ජීවීන් ජීවත් වන වටපිටාවයි.
2. මිනිසා ඇතුළු සියලු ජීවීන් ජීවත් වන වටපිටාවයි.
3. ජීවීන් හැර අජීවී දේ සහිත වටපිටාවයි.
4. මුහුද හැර ගොඩබිමට අයත් වටපිටාවයි.

**03**. ලෝකයේ පවතින මුළු ජල ප්‍රමාණයෙන් බීමට භාවිත කළ හැකි ප්‍රතිශතය,

1. 0.94% කි.
2. 0.64% කි.
3. 0.34 % කි.
4. 0.24 % කි.

**04**. දිවා රෑ පින් ලැබෙන පින්කමක් වන්නේ,

1. යාචකයන්ට දන් දීමයි.
2. වන උයන් තැනීමයි.
3. පහන් පූජා කිරීමයි.
4. මල් පූජා කිරීමයි.

**05**. සියලු සතුන්ට මෙත් වඩන ලෙස උපදෙස් ඇත්තේ,

1. රතන සූත්‍රයේ ය.
2. මහා මංගල සූත්‍රයේ ය.
3. කරණීය මෙත්ත සූත්‍රයේ ය.
4. අටවිසි පිරිත් සූත්‍රයේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. පහත වාක්‍ය නිවැරදි නම් '√ ' ලකුණ ද, වැරදි නම් '×' ලකුණ ද යොදන්න.**

I. පරිසර දූෂණයෙන් තුරුලිය විනාශ වී වැස්ස අඩු වේ. (……..)

II. අපට පිරිසිදු වාතය ලැබෙන්නේ පරිසරයෙනි. (……..)

III. ප්ලාස්ටික් හා පොලිතින් පරිසරයට හානි නො කරයි. (……..)

IV. බුදු දහම අනුව රජතුමා සතුන් ද රැකිය යුතු ය. (……..)

V. වැසි කාලයේ භික්ෂූන් වහන්සේලා වස් විසිය යුතු ය. (……..)

**07. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

I. බුදු රජාණන් වහන්සේ සුන්දර ............................ ඇලුම් කළ සේක.

II. ඇළ දොළට අපද්‍රව්‍ය දැමීමෙන් ............................ දූෂණය වේ.

III. වාහනවල විෂ ......................... පෙනහැලි රෝග ඇති කරයි.

IV. බුදු දහමේ වැස්ස ..................... ලෙස හඳුන්වා දී ඇත.

V. ගස් කැපීම, අතු කැඩීම .......................... භික්ෂූන්ට වරදකි.

(මිතුරකු, දුම්, පරිසරය ,උපසම්පදා, ජලය)

**08. පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට ඉටු කළ හැකි කරුණු පහක් ලියන්න.**

I. ..........................................................................................................

II. ..........................................................................................................

III. ..........................................................................................................

IV. ..........................................................................................................

V. ..........................................................................................................

(ල.20)

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - පාඩම 16 - පිළිතුරු

**01.** – 1 **02.** – 2 **03.** – 3 **04.** – 2 **05.** – 3

**06.** (i) √ (ii) √ (iii) × (vi) √ (v) √

**07.** (i) පරිසරයට
(ii) ජලය
(iii) දුම්
(vi) මිතුරකු
(v) උපසම්පදා

**08.** (i) ගස් වැල් සිටුවා රැක ගැනීම
(ii) දිරන කොළ රොඩු ආදියෙන් පොහොර සෑදීම
(iii) නොදිරන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැරලීම
(vi) දිනපතා අවට පරිසරය පවිත්‍ර කිරීම
(v) පරිසරය රැකීමේ අගය අන් අයට කියා දීම (ආදී සුදුසු කරුණු පහක්)

(ල.20)

| අධ්‍යාපන අමාත්‍යාංශය | ආගමික හා සාරධර්ම ශාඛාව |
|---|---|
| සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)<br>කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය | |

# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 8.0

**ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.8.1

**මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂී සිදුවීම් අගයමින් එම උරුමයන් රැක ගැනීමට කටයුතු කරයි.**

# පාඩම

**17 මිහිඳු මාහිමි සමය වෙත යමු**


අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 8.0**
**නිපුණතා මට්ටම - 6.8.1**
**පාඩම - 17 මිහිඳු මාහාමි සමය වෙත යමු**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**1.** මිහිඳු මහරහතන් වහන්සේගේ පියාණන් වූයේ,

1. දුටුගැමුණු මහරජතුමාය. 2. ධර්මාශෝක මහරජතුමාය.
3. දේවානම්පියතිස්ස මහරජතුමාය. 4. මහානාග යුව රජතුමාය.

**2.** තෙවන සංගායනාව සිදුවූයේ බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන්.

1. වසර 100 ක දී ය. 2. වසර 226 ක දී ය.
3. වසර 236 දී ය. 4. වසර 500 ක දි ය.

**3.** අසිරිමත් මහින්දාගමනය සිදුවූයේ,

1. වෙසක් පුන් පොහෝ දින දී ය. 2. පොසොන් පුන් පොහෝ දින දී ය.
3. ඇසළ පුන් පොහෝ දින දී ය 4. බක් පුන් පොහෝ දින දී ය.

**4.** මිහිඳු මහරහතන් වහන්සේ අඹ ප්‍රශ්නය සහ ඥාති ප්‍රශ්නය විමසූයේ රජතුමාගේ,

1. බුද්ධිමත් බව දැනගැනීමටයි. 2. තරුණබව දැනගැනීමටයි.
3. වයස දැනගැනීමටයි. 4. සාක්ෂරතාව දැනගැනීමටයි.

**5.** චූල්ලහත්ථිපදෝපම සූත්‍රය අසා රහත්භාවයට පත් වූයේ,

1. දේවානම්පියතිස්ස රජතුමාය. 2. සුමන සාමණේරයන් වහන්සේ ය.
3. භණ්ඩුක උපාසකතුමා ය. 4. අනුලා දේවිය ඇතුළු පිරිස ය.

(ල.05)

අධ්‍යාපන අමාත්‍යංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. පහත වාක්‍ය නිවැරදි නම් '√ ' ලකුණ ද, වැරදි නම් '×' ලකුණ ද යොදන්න.**

1. භණ්ඩුක උපාසකතුමා අනාගාමී උතුමෙකි. (……..)
2. ලංකාවේ මුල්ම පන්සල කාලපාසාද පිරිවෙනයි. (……..)
3. මිහිඳු මාහිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා මුලින්ම වස් විසූයේ අනුරාධපුරයේ දී ය. (……..)
4. මුලින්ම පැවිදි වූ ලාංකිකයා භණ්ඩුක උපාසකතුමා ය. (……..)
5. ථූපාරාමය පඨමක චේතිය නමින්ද හැඳින්වේ. (……..)

(ල.10)

**07. මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීම නිසා ශ්‍රී ලාංකේය අප ලද දායාද පහක් ලියන්න.**

1. ……………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………

(ල.05)


අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - පාඩම 17 - පිළිතුරු

**01.** – 2 **02.** – 3 **03.** – 2 **04.** – 1 **05.** – 2

(ල.05)

**06.** (1) √ (2) √ (3) × (4) × (5) √ (ල.10)

**07.** (1) විධිමත් පුද පූජා ක්‍රමයක් ඇතිවීම.

(2) භික්ෂු සමාජයක් ඇතිවීම.

(3) සර්වඥ ධාතු වැඩමවීම.

(4) වෙහෙර විහාර ආරාම ඉදිවීම.

(5) දුමින්දාගමනය සිදුවීම.

(6) දේශීය සාහිත්‍ය පෝෂණය.

(7) අධ්‍යාපනය දියුණු වීම.

(ආදී සුදුසු කරුණු පහක්)

(ල.05)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 8.0

**ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.8.2

**දූමින්දාගමනයෙන් ලත් දායාද අගයමින් ඒවා රැක ගැනීමට ක්‍රියා කරයි.**

# පාඩම

**18 ශාසනික දායාද සුරකිමු**

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 8.0**
**නිපුණතා මට්ටම - 6.8.2**
**පාඩම 18 ශාසනික දායාද සුරකිමු**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01.** සඟමිත් තෙරණින් වහන්සේත් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් වඩවමන ලද්දේ,

1. වෙසක් පුන් පෝ දිනයි.
2. පොසොන් පුන් පෝ දිනයි.
3. ඇසළ පුන් පෝ දිනයි.
4. උඳුවප් පුන් පෝ දිනයි.

**02.** බෞද්ධ ජනයා ඓතිහාසික ස්ථාන වන්දනා කිරීමේ දී,

1. කැටයම් ස්පර්ශ කොට බැලිය යුතුය.
2. බිත්ති මත කුරුටු ගී ලිවිය යුතුය.
3. චිත්‍ර මත තීන්ත ආලේප කළ යුතුය.
4. නැරඹීමෙන් සතුටු විය යුතුය.

**03.** ලංකාවේ දී පැවිදි වූ ප්‍රථම කාන්තාව වූ අනුලා දේවිය,

1. මිහිඳු මාහිමියන්ගේ සොයුරියයි.
2. දෙවිපියතිස් රජුගේ සොයුරියයි.
3. මහනාග යුව රජුගේ සොයුරියයි.
4. අරිට්ඨ කුමරාගේ සොයුරියයි.

**04.** ලෝකයේ පැරණිම ඓතිහාසික වෘක්ෂය ලෙස සැලකෙන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ,

1. ශාරීරික චෛතියක් ලෙස සැලකේ.
2. පාරිභෝගික චෛතියක් ලෙස සැලකේ.
3. උද්දේශික චෛතියක් ලෙස සැලකේ.
4. අදෘශ්‍යමාන චෛතියක් ලෙස සැලකේ.

**05.** බෝධි පූජා පැවැත්වීමේ දී සිදුකරනු ලබන චාරිත්‍රයක් වන්නේ,

1. මන්ත්‍ර ආදිය කියා දෙහි කැපීමයි.
2. කන්නලව් කරමින් පොල් ගැසීමයි.
3. සුවඳ පැන්වලින් බෝධිය නැහැවීමයි.
4. කවි ලියා බෝ ශාඛාවල එල්වීමයි.

(ල.05)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. A කොටසේ කරුණු B කොටසේ කරුණු සමඟ ගළපා අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.**

**<u>A කොටස</u>**

- **i.** අරහත් සඟමිත් තෙරණිය වඩමවාගෙන ඒමට දඹදිවට පිටත්ව ගියේ, ……………….. ☐
- **ii.** බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට සහ පුද පූජා පැවැත්වීමට පැමිණියේ, ……….......  ☐
- **iii.** දුමින්දාගමනය ලෙස හැඳින්වෙන්නේ, …………………………………………..... ☐
- **iv.** භික්ෂුණීන් වහන්සේලා සඳහා පූජා කරන ලද ආරාමය, ……………………….....  ☐
- **v.** කරවටක් මුහුදේ බැස බෝධීන් වහන්සේ ගෞරවයෙන් පිළිගත්තා ලද්දේ, ………... ☐

(ල.05)

**<u>B කොටස</u>**

a) දේවානම්පියතිස්ස රජතුමා විසිනි.

b) අරිට්ඨ නම් කුමාරයා ය.

c) බෝධි ආගමනයයි.

d) ශිල්ප ශ්‍රේණි 18 ක ජනයා ය.

e) හත්ථාලක මෙහෙණවරයි.

**07. දුමින්දාගමනයෙන් අපට උරුම වූ සංස්කෘතික උරුමයන් රැකීමට කළ යුතු දේවල් පහක් ලියන්න.**

1. .......................................................................................................................
2. .......................................................................................................................
3. .......................................................................................................................
4. .......................................................................................................................
5. .......................................................................................................................

(ල.05)
(මුළු ලකුණු 20)

අධ්‍යාපන අමාත්‍යාංශය　　　　　　　　　　　　ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 18 - පිළිතුරු

**01.** – 4 **02.** – 4 **03.** – 2 **04.** – 2 **05.** – 3

(ල.05)

**06.** (i) **b** (ii) **d** ( iii) **c** (iv) **e** (v) **a**

(ල.05)

**07.** (1) උපදෙස් අනුවම ඓතිහාසික ස්ථාන නැරඹීම

(2) කලා නිර්මාණවලට හානි නොකිරීම

(3) පැරණි සාහිත්‍ය පොතපත කියවා දැනුම දියුණු කිරීම

(4) උතුම් පුද සිරිත් ඒ අයුරින්ම අනුගමනය කිරීම

(5) පුරාවස්තු ආරක්ෂා කිරීම

(6) ශ්‍රී ලාංකීය ඉතිහාසය හදාරමින් සංස්කෘතික උරුමයන් රැකීමට එකතුවීම

(ආදී සුදුසු කරුණු පහක්)

(මුළු ලකුණු 20)


| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | ආගමික හා සාරධර්ම ශාඛාව |

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 9.0

**බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.9.1

**සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි.**

# පාඩම

**19 අරපිරිමැස්ම දියුණුවට මගකි.**

අධ්‍යාපන අමාත්‍යාංශය
ආගමික හා සාරධර්ම ශාඛාව


සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 9.0**
**නිපුණතා මට්ටම - 6.9.1**
**පාඩම - 19 අරපිරිමැස්ම දියුණුවට මගකි**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01.** **"ජීවකාරාම පූජා කථාව"** ඇත්තේ,

1. දීපාවලියේ ය.
2. පූජාවලියේ ය.
3. දීපවංශයේ ය.
4. ථූපවංශයේ ය.

**02.** සාකේත නුවර සිටු දේවියට ප්‍රතිකාර කිරීමට ඉදිරිපත් වූයේ,

1. දිසාපාමොක් වෛද්‍යතුමා ය.
2. ජීවක වෛද්‍යතුමා ය.
3. සාකේත නුවර සිටුතුමා ය.
4. සිටු දේවියගේ සේවිකාව ය.

**03.** සම්පත් අරපිරිමැස්මේ දී,

1. ලෝභකම මූලිකවේ.
2. මසුරුකම මූලිකවේ.
3. සඟවා තැබීම මූලිකවේ.
4. යහ භාවිතය මූලිකවේ.

**04.** පවුලක අරපිරිමැස්ම සිදුකළ යුත්තේ,

1. අම්මා විසිනි.
2. තාත්තා විසිනි.
3. දරුවන් විසිනි.
4. සියලු දෙනා විසිනි.

**05.** අරපිරිමැස්ම දියුණුවට මඟක් වන්නේ ,

1. සම්පත් භාවිතය ඉහළ යන නිසා ය.
2. සම්පත් නිෂ්පාදනය ඉහළ යන නිසා ය.
3. සම්පත් ආරක්ෂාවීම ඉහළ යන නිසා ය.
4. සම්පත්වල මිල ඉහළ යන නිසා ය.

(ල.05)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. පහත වාක්‍ය නිවැරදි නම් '√ ' ලකුණ ද, වැරදි නම් '×' ලකුණ ද යොදන්න.**

i. සම්පත් රැකීමට අදාළ උපදෙස් 4 ක් ඇත්තේ අංගුත්තර නිකායේ කුල සූත්‍රයේ ය. (……..)

ii. විනාශ වූ සම්පත් වෙනුවට දිරාගිය සම්පත් සපයාගත යුතුය. (……..)

iii. දිරාගිය සම්පත් සොයා බලා ඒවා අළුත්වැඩියා කළ යුතුය. (……..)

iv. අසීමිතව ආහාරපාන භාවිත කිරීම ඉහළ දැමිය යුතුය. (……..)

v. චරිතවත් ස්ත්‍රී හෝ පුරුෂ අයෙකු නායකත්වයට පත් කළ යුතුය. (……..)

(ල.05)

**07. පාසලේ සම්පත් අපතේ යන අවස්ථා පහක් පෙන්වා දෙන්න.**

1. ……………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………

(ල.10)


අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 19 - පිළිතුරු

**01.** – 2 **02.** – 2 **03.** – 4 **04.** – 4 **05.** – 3

(ල.05)

**06.** (i) √

(ii) ×

(iii) √

(iv) ×

(v) √

(ල.05)

**07.** (1) අනවශ්‍ය විදුලි බුබුළු හා පංකා නිවා නොදැමීම.

(2) ජලකරාම නිසි ලෙස නඩත්තු නොකිරීම.

(3) පොත්පත් භාවිතයට නොගෙන ඉවත දමා තිබීම.

(4) හුනු කැබලි සම්පූර්ණයෙන් භාවිත නොකර ඉවත දැමීම.

(5) කැඩුණු ඩෙස් පුටු ආදිය අලුත්වැඩියා නොකිරීම.

(6) පාසලේ බඩු බාහිරාදිය තෙමී දිරන්නට ඉඩ හැරීම.

(ආදී සුදුසු කරුණු පහක්)

(ල.10)
(මුළු ලකුණු 20)


අධ්‍යාපන අමාත්‍යංශය  ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 9.0

**බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.9.2

**සම්පත් පරිභෝජනයේදී දැඩි ලෝභය හානිකර බව පිළිගෙන ක්‍රියා කරයි.**

# පාඩම

**20 රන් පිහාටු**

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 9.0**
**නිපුණතා මට්ටම - 6.9.2**
**පාඩම - 20 රන් පිහාටු**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ අයත් වන්නේ,

1. අනුරපුර යුගයටයි.
2. පොළොන්නරු යුගයටයි.
3. ගම්පොළ යුගයටයි.
4. කුරුණෑගල යුගයටයි.

**02**. පන්සිය පනස් ජාතක පොතෙහි බෝසත් චරිතයට අදාළ කථා වස්තු ගණන,

1. 500 කි.
2. 547කි.
3. 550කි.
4. 557කි.

**03**. ස්වර්ණ හංස ජාතකයෙන් ලබාදෙන ආදර්ශය පහත පිළිතුරුවලින් තෝරන්න,

1. දැඩි ලෝභය ධනවත් වීමට හේතුවේ.
2. දැඩිලෝභය සකසුරුවම්කමට හේතුවේ.
3. දැඩි ලෝභය සැපවත් වීමට හේතුවේ.
4. දැඩි ලෝභය දුකට පත් වීමට හේතු වේ.

**04**. ස්වර්ණ හංසයා ට පෙර භවය දැකීමේ හැකියාව ඇති වූයේ,

1. සිල් රැකීම් ආදී ගුණ නිසාය.
2. දේව බලයක් ලැබීම නිසාය.
3. පියාසර කිරීමේ හැකියාව නිසාය.
4. හංසයකු වී උපන් නිසාය.

**05**. පෙර ආත්ම භාවය දැකීමේ හැකියාව,

1. දිබ්බසෝත ඥානය නම් වේ.
2. ජාතිස්මරණ ඥානය නම් වේ.
3. දිබ්බචක්ඛු ඥානය නම් වේ.
4. චුතූපපාත ඥානය නම් වේ.

( ල. 10.)

අධ්‍යාපන අමාත්‍යංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06.** **පහත "අ" සිට "ඒ" දක්වා වාක්‍ය දහයෙන් දැක්වෙන ස්වර්ණ හංස ජාතක කථාව පිළිවෙළට ලියා නැත. නිවැරදි පිළිවෙළ ලැබෙන සේ ඉදිරියේ ඇති කොටු තුළ අංක යොදන්න.**

අ. ☐ ස්වර්ණ හංසයා නිවසට පැමිණ රන් පිහාටුව බැගින් ලබා දෙයි.

ආ. ☐ ගලවන ලද පිහාටු සියල්ල සුදු පැහැ වේ.

ඇ. ☐ බිරිඳට සියලු පිහාටු ගලවාගැනීමට ලෝභ සිතක් ඇති වෙයි.

ඈ. ☐ බෝසතාණෝ ස්වර්ණ හංසයකු ව හිමාලයේ උපදී.

ඉ. ☐ දරුවන්ගේ විරෝධය නොතකා බැමිණිය සියලු පිහාටු ගලවයි.

ඊ. ☐ පෙර ආත්ම භාවය දැකීමේ නුවණින්, හංසයා තම පවුල දුක් විඳින අයුරු දකී.

උ. ☐ පෙර භවයේ බිරිඳට හා දරුවන්ට උදවු කිරීමට හංසයා සිතයි.

ඌ. ☐ රන් පිහාටු විකුණා පොහොසත් වන බිරිඳ බැල මෙහෙ කිරීම නවතයි.

එ. ☐ අධික ලෝභය නිසා බිරිඳ හා දරුවන් නැවත දුකට පත්වේ.

ඒ. ☐ හංසයා අසරණ වේ. අලුතෙන් එන පිහාටු ද සුදුය. ඔහු පියඹා යන්නට යයි.

(ල.10)

## 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 20 - පිළිතුරු

**01.** – 4 **02.** – 2 **03.** – 4 **04.** – 1 **05.** – 2 (ල.10)

**06.** අ - **4**

ආ - **8**

ඇ - **6**

ඈ - **1**

ඉ - **7**

ඊ - **2**

උ - **3**

ඌ - **5**

එ - **10**

ඒ - **9**

(ල.10)


අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 10.0

**නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.**

# නිපුණතා මට්ටම - 6.10.1

**බෞද්ධ ප්‍රතිපදාවේ එන ශ්‍රද්ධාව හා ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ හැඳින සැදැහැවත්ව කටයුතු කරයි.**

# පාඩම

**21 සැදැහැ ගුණයෙන් සරුවෙමු.**

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

විෂය - බුද්ධ ධර්මය 6 ශ්‍රේණිය
නිපුණතාව - 10
නිපුණතා මට්ටම - 6.10.1
පාඩම - 21 සැදැහැ ගුණයෙන් සරු වෙමු

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. අවබෝධයෙන් තෙරුවන් කෙරෙහි පැහැදීම,

1. අමූලික ශ්‍රද්ධාව නම් වේ.
2. ආකාරවතී ශ්‍රද්ධාව නම් වේ.
3. ආගමික භක්තිය නම් වේ.
4. ආගමික විශ්වාසය නම් වේ.

**02**. සැදැහැවතාගේ ලක්ෂණයක් නොවන්නේ,

1. සිල්වතුන් දැකීමට කැමැත්තයි .
2. දහම් ඇසීමට කැමැත්තයි.
3. පරිත්‍යාගශීලී වීමට කැමැත්තයි.
4. දහම් ගී කීමට කැමැත්තයි.

**03**. සැදැහැවතා ගේ ලක්ෂණ ඇතුළත් ගාථාව වන්නේ,

1. දස්සනකාමෝ සීලවතං...... යන්නයි.
2. සුපතිට්ඨිත රට්ඨනුරාධපුරේ...... යන්නයි.
3. සමනාමයං මහා රාජ....... යන්නයි.
4. ආරාමරෝපා වනරෝපා....... යන්නයි.

**04**. බෞද්ධ අප විසින් කළ යුතු කටයුතු අතර ඉහළම කටයුත්තක් වන්නේ,

1. ස්වාමීන් වහන්සේලා දැකීමයි .
2. ස්වාමීන්වහන්සේලාට වැඳීමයි.
3. ස්වාමීන් වහන්සේලාට උපකාර කිරීමයි.
4. ස්වාමීන්වහන්සේලා ආදර්ශයට ගැනීමයි.

**05**. වර්තමානයේ බෞද්ධ අප සියලු දෙනාගේම ශාස්තෘවරයා වන්නේ,

1. ධර්මයයි .
2. දෙමාපිය දෙදෙනායි.
3. සිල්වත් අයයි.
4. සඟරුවනයි.

(ල.10)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. පහත ප්‍රකාශය නොගැළපේ. එම ප්‍රකාශය ශාසනික වචන යොදා නැවත ගෞරවාර්ථයෙන් ලියන්න.**

| |
|---|
| ස්වාමීන් වහන්සේලා ගෙයින් එළියට පැමිණ, මිදුල් අතුගා, අත් සෝදා තේ බොති. |

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

( ල. 10)

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | ආගමික හා සාරධර්ම ශාඛාව |
| සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය) කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය | |

## 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 21 - පිළිතුරු

**01.** – 2

**02.** – 4

**03.** – 1

**04.** – 4

**05.** – 1 (ල.10)

**06.** ස්වාමීන් වහන්සේලා ලැගුම් ගෙයින් එළියට වැඩම කොට, මළ ඇමද, දැත් ධෝවනය කොට, ගිලන් පස වළඳිති.

(ල.10)

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | ආගමික හා සාරධර්ම ශාඛාව |
| සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)<br>කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය | |